## මාතර විශ්ව විද්‍යාල විද්‍යායතනය - 2018

----------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මාතර, විශ්ව විද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතර විශ්ව විද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7හි 13 ඡේදය අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබු රු.96,100 ක් වූ උපකරණ, වර්ෂයට අදාළ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | රු.96,100 ක් වූ ද්‍රව්‍ය හා උපකරණ තුළ යකඩ නැවීම, කැපීම, පෑස්සීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදාගන්නා පරිභෝජන ද්‍රව්‍යයන් වේ. එම නිසා එම වියදම වර්ෂයට අදාල වියදමක් ලෙස ගිණුම්ගත කරන ලදි. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව වර්ෂයකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගැනීමේ අපේක්ෂාවෙන් මිලදී ගන්නා වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 19 වැනි ඡේදය අනුව කටයුතු නොකර විශ්ව විද්‍යාල විද්‍යායතනයේ මායිම් වැටට හා ආරක්ෂක කුටියට විදුලිය සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා වැය කරන ලද රු.223,262 ක් වූ වියදම් , පුනරාවර්තන වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | අනාරක්ෂිතව මුරකුටියට ලබාදී තිබුණු විදුලි සම්බන්ධතාවය සිසුන්ගේ සහ සේවකයන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රමවත්ව භූගතව සැපයීමට සහ විද්‍යායතනයේ අලංකාරය සහ ආරක්ෂාව සඳහා මායිම් වැට දිගට විදුලි පහන් සවිකිරීම සහ ඒ සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදීම සඳහා මෙම වියදම දරන ලදී. එම නිසා මෙම වියදම පුනරාවර්තන වියදමක් ලෙස වර්ගීකරණය කරන ලදි. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය අනුව කටයුතු නොකිරීම නිසා විද්‍යායතනයේ භාවිතයේ පවතින 2015 වර්ෂයේ මිලදීගත් රු.4,357,938 ක් වූ පුස්තකාල පොත් 1500 ක් ලියා හල වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණි. | 2019 වර්ෂය තුලදී විධිමත් කමිටුවක් පත්කොට මෙම ශුන්‍ය අගයක් ගන්නා ලද පොත්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු සම්පාදනය කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාල මගින් හඳුන්වා දී ඇති ගිණුම් විෂයයන් අනුව ධාරිතා සංවර්ධනය වෙනුවෙන් සිදුකරන වියදම් විෂය අංක 2112 යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, වටිනාකම රු.1,935,500 ක් වූ වියදම් පුනරාවර්තන වියදම් සේ ගිණුම් ගත කර තිබුණි. | විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව ධාරිතා සංවර්ධනය සඳහා කරනු ලබන සියළුම වියදම් පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. | වෘත්තීය හා තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් හඳුන්වා දී ඇති ගිණුම් විෂයයන් අනුව ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාල පනතේ 45 වන වගන්තිය අනුව භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතියට යටත්ව වාර්ෂික ඇස්තමේන්තුවල එක් ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට අරමුදල් මාරුකිරීමට හැකි වුවද රු.263,500 ක ප්‍රාග්ධන අරමුදල් අනුමැතියකින් තොරව පුනරාවර්තන අරමුදල්වලට මාරුකර තිබුණි. | විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව ධාරිතා සංවර්ධනය සඳහා කරනු ලබන සියළුම වියදම් පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාල පනත අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | විශ්ව විද්‍යාල විද්‍යායතනය සඳහා තරුණ කටයුතු හා මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 6 (f) වගන්තිය. | විශ්වවිද්‍යාල විද්‍යායතන දේශකවරුන් විසින් අවම වශයෙන් සතියකට පැය 25 ක් ඉගැන්වීම් කටයුතු සිදුකළ යුතු වුවත්, ඉගැන්වීම් කටයුතු සිදුකළ පැය ගණන පැය 3.5 ත් 18 ත් අතර, පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි විශ්ව විද්‍යාල දේශකවරුන් විසින් අවම වශයෙන් සතියකට පැය 25 ක් ඉගැන්වීම් කටයුතු කලයුතු බව සඳහන් වුවද, එය 2015 දී TVEC හා UNIVOTEC නිලධාරීන් විසින් පැය 20 ක් දක්වා සංශෝධනය කරන ලදි. | මෙහෙයුම් අත් පොත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | විශ්ව විද්‍යාල විද්‍යායතන මෙහෙයුම් අත්පොතේ 4.7.3. (ඒ) වගන්තිය | එක් එක් පාඨමාලාවල සිසුන් සඳහා දෛනිකව සිදුකරන දේශන හා ප්‍රායෝගික පුහුණු කිරීම් සටහන් කිරීම් සඳහා හා දේශන සිදුකිරීම් අධීක්ෂණය කර වාර්තා කිරීම සඳහා ප්‍රගති වාර්තා පොත් පවත්වා නොතිබුණු අතර, දෛනික ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය හා විෂය අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතිණි. | මෙම සමාසිකය සඳහා ප්‍රගති වාර්තා පොත් පවත්වාගෙන යාමට කටයුතු කරන අතර අධීක්ෂණ කටයුතු ද ඉදිරියේ දී නිසි පරිදි සිදු කරනු ලැබේ. | ලැබී ඇති උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.627,212 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,356,875 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,729,663 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු.11,069,100 ක් වැඩියෙන් ලැබී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජූලි සිට දෙසැම්බර් දක්වා සමාසිකය සඳහා පාඨමාලා 08 ක සිද්ධාන්ත පැය 2,910 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 1,295 ක් බාහිර දේශකයින් 28 දෙනෙකු මගින් ආවරණය කර ගැනීමට සැලසුම් කර ඒ සඳහා පත්වීම් ලිපි නිකුත් කර තිබුණද , බාහිර දේශකවරුන් විසින් ආවරණය කළ යුතු විෂයයන්, ඉගැන්විය යුතු පැය ගණන් ගෙවන ගාස්තු හා අනෙකුත් කොන්දේසි ඇතුළත් කරමින් දෙපාර්ශවය විසින් විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි. | මෙහි සඳහන් කර ඇති පරිදි පත්වීමේ ලිපියේ ආවරණය කළ යුතු විෂයයන්වල ඉගැන්විය යුතු පැය ගණන හා අනෙකුත් කොන්දේසි ඇතුළත් කර තිබුණි. 2018/07/25 දින සිට ඇරඹි සමාසිකය සඳහා පමණක් 2018/07/23 කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් ලද ලිපිය අනුව නිශ්චිත ගාස්තුවක් තීරණය කරන තෙක් ගාස්තු රහිතව පත්වීම් ලිපි නිකුත් කරන ලදී. | පත්වීම් ලිපියේ කොන්දේසි ඇතුළත් කලද එය ගිවිසුමක් නොවන බැවින් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් නීතිමය ලියවිල්ලක් නොවන බැවින් ගිවිසුමකට එකග විය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංචාරකසේවා කළමනාකරණය විෂය ආවරණය කිරීමට බාහිර දේශකයින් 6 දෙනෙකුගේ සේවය ලබාගෙන සිද්ධාන්ත පැය 152 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 2 ක් පවත්වා තිබූ අතර, ඔවුන්ගෙන් දෙදෙනකු පත්කිරීම විධිමත් පරිදි සිදු කරනොතිබුණි. | සංචාරක සේවා කළමනාකරණය සඳහා විෂයය ආවරණය කිරීම සඳහා බාහිර දේශකයන් හය දෙනෙකුගෙන් හතර දෙනෙක් සඳහා විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දී තිබූ අතර සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ දේශකයින් දෙදෙනෙක් සඳහා පත්වීම් ලිපි ලබා දී නොතිබුණි. ඔවුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලිපි ලබා දීමට කටයුතු කරනු ලැබේ. | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පත්වීම් ලිපි ලබාදීම සේවය ලබා ගැනීමට පෙර සිදුවිය යුතුය. |
| (ඇ) | 2018 ජුලි සිට දෙසැම්බර් දක්වා වු කාලය තුල NVQ 5 හි දෙවන හා NVQ 6 හි පළමු සමාසිකයට අදාළ පාඨමාලා 07 හි බාහිර දේශකයින් ලවා ඉගැන්වීමට සැලසුම්කල ප්‍රායෝගික පුහුණු කිරීම් කාලයෙන් සියයට 48 ක් සියයට 100 ත් අතර පරාසයක ප්‍රමාණයක් ඉටුකර නොතිබුණි. | බාහිර කථිකාචාර්යවරයෙකුගේ පැයක වේතනය නිශ්චිතව සඳහන් නොකිරීම නිසා ඔවුන් සේවයෙන් ඉවත් විය. 2019 වර්ෂයේ පළමු හා දෙවන සමාසිකවලදී මඟ හැරුණු විෂයයන් ආවරණය කිරීමට කටයුතු කරමි. | යම් පාඨමාලාවක විෂය මාලාවක් යම් කාල රාමුවක් තුළ නිම කිරීම කල යුතුය. |
| (ඈ) | 2018 ජනවාරි සිට ජුනි දක්වා අධ්‍යයන කාලය තුලදීද, පාඨමාලා 07 හි බාහිර දේශකයින් මගින් සිද්ධාන්ත පැය 2,230 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 1,244 ක් ඉටු කිරීමට සැලසුම්කර තිබුණද, සිද්ධාන්ත පැය 1,134 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 212 ක් පමණක් ඉටුකර තිබුණි. ඒ අනුව සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණු පැය ආවරණය සියයට 51 ක් හා සියයට 19 ක් වී තිබුණි. | ඉහත විෂය නිර්දේශයන්හි සිද්ධාන්ත හා ප්‍රායෝගික අධ්‍යයනයන් පැවැත්වීමේ දී සම්මුඛ හා ස්වයං අධ්‍යයන මගින් ආවරණය කරන අතර ඒ සඳහා ස්වයං ප්‍රායෝගික පරීක්ෂණ ස්වයං පරිශීලන ග්‍රන්ථ මගින් ඉහත සඳහන් ඉටු නොකළ පැය ගණන් ආවරණය කොට ඇත. | ස්වයං අධ්‍යයන මගින් ආවරණය වන්නේ නම් එම විෂය කොටස් කාල සටහන්වලට ඇතුළත් කර එම විෂයයන් සඳහා දේශකවරයකු යෙදීම අවශ්‍ය නොවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා අධ්‍යයන කාලය තුළ දී බාහිර දේශනයන් මගින් පාඨමාලා 08 ක සිද්ධාන්ත පැය 2,915 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 1,295 ක් ආවරණය කිරීමට සැලසුම් කර තිබුණද, සිද්ධාන්ත පැය 1,884 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 391.75 ක් පමණක් ඉටුකර තිබුණි. ඒ අනුව ආවරණය කර නොතිබුණු සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණු පැය ප්‍රමාණය පිළිවෙළින් සියයට 65 ක් සහ සියයට 30 ක් වී තිබුණි. | දෙවන සමාසිකය තුළ දී සිදුවූ සංශෝධන හේතු කොට ගෙන බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම දුෂ්කර වූ අතර ඉහත සමාසිකයේ සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණු සඳහා ආවරණය කළ යුතු මූලික කරුණු ආවරණය කිරීමට කටයුතු කර ඇත. ඉදිරි සමාසිකවල දී අදාළ විෂයයන් සඳහා අනුබද්ධ පැවරුම් මගින් ආවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි සමාසිකවලදී එම සිසුන් ඉහළ මට්ටමකට යන අතර, NVQ 6 මට්ටමේ සිසුන් පාඨමාලාව අවසන්ව ගොස් සිටී. අදාළ සාමාසිකය තුළදී නියමිත විෂය කොටස් ආවරණය කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවල ස්වයං චලන තාක්ෂණ අංශය වෙත මිලදී ගෙන තිබුණු රු.3,654,840 ක් වටිනා උපකරණ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | මෙම (5,9,19,21 යන අංක යටතේ දක්වා ඇති) උපකරණ සඳහා අවශ්‍ය විදුලි සැපයුම දැනට සකස් කොට ඇති අතර ක්‍රමවත් සහ ආරක්ෂාකාරී ලෙස ජලය සැපයුම හා උණු ජලය , අප ජලය ක්‍රමවත්ව බැහැර කිරීමට හැකිවන පරිදි විද්‍යාගාරය තුළ ජල නල පද්ධතියක් සකස් කිරීම සඳහා පියවර ගෙන ඇත. | අවශ්‍යතා හඳුනා ගෙන ඒ අනුව මිලදී ගැනීම සිදු කළ යුතු අතර ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් හා හැකියාවෙන් පිරිපුන් සිසුන් කොටසක් බිහිකිරීම සඳහා සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල යෙදවිය යුතුය. |
| (ආ) | සිසුන්ගේ ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සඳහා 2015 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.4,256,268 ක් වූ පුහුණු උපකරණ 2019 පෙබරවාරි 28 දින වන විටත් ප්‍රායෝගික පුහුණු කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි. | පවත්නා සීමිත ඉඩ ප්‍රමාණවත් නොවීම විශාල බාධාවක්ව පවතින අතර සීමිත ඉඩ කඩ තත්ත්වය යටතේ වුවත් Wheel balancing machine/pedestal grinder යන උපකරණ අවශ්‍යතාවයට අනුව භාවිතා කරනු ලැබේ. | විෂය නිර්දේශ කොටස් ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සිදු කිරීමෙන් තාත්වික පුද්ගලයකු සමාජයට දායාද කරන බැවින් එම විෂය කොටස් ඒ අනුව සිදු කිරීම අවශ්‍ය වේ. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) වගන්තිය අනුව කටයුතු නොකර රු.2,126,125 ක ප්‍රාග්ධන වත්කම් ප්‍රතිපාදන නොතිබියදී මිලදී ගෙන තිබුණි. | 2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරය මඟින් අප ආයතනයට රු.මිලියන12 ක් වෙන්කර තිබූ අතර එම ප්‍රතිපාදනයන් තුළ අප ආයතනය කටයුතු කරන ලදී. නමුත් 2018 වර්ෂයේ භාණ්ඩාගාරය මඟින් මුදල් නිදහස් නොකිරීම නිසා මිල දී ගත් ප්‍රාග්ධන භාණ්ඩ කිහිපයක් සඳහා මුදල් ගෙවීමට නොහැකි විය. | ස්ථිරවම ප්‍රතිපාදන ලැබී තිබේ දැයි සොයා බලා මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි. | අප ආයතනයේ අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකිව තිබේ. එබැවින් අභ්‍යන්තර විගණනයක්ද සිදු කිරීමට නොහැකි වී තිබේ. ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

4.2 **විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක පී.ඊ.ඩී. 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යායතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | අප ආයතනය තුළ විගණන හා කළමනාකරණ කමිටුවක් නොමැති බැවින් 2017 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විද්‍යාලයේ පැවැති විගණන හා කළමනාකරණ කමිටුවට අනුබද්ධකර විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු ස්ථාපිත කළ යුතුය. |